පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

පෙබරවාරි 03 සතිය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

පාසල - ර/නිව්/කරවිට මධ්‍ය විද්‍යාලය

නිපුණතාව :- දේශීය විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ශෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලා ලක්ෂණ නිර්මාණ කරණයේදී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම :- ඓතිහාසික ශෘහ නිර්මාණ ආශ්‍රිත කලා අංග අධ්‍යනය කරයි.

ක්‍රියාකාරකම :- මුරගල අගයමු

පැවරුම :- පහත කියවීම් පත්‍රිකාව කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කියවීම් පත්‍රිකාව

මූරගල

- පූජනීය ස්ථානයකට පිවිසෙන පඩි පෙළ පාමුල සඳකඩ පහණට දෙපසින් ඇති කැටයම් සහිත ගල් පුවරුව මූරගල නමින් හැඳින්වේ.
- කොරවක් ගල සඳහා ආධාරකයක් ලෙසත් පියගැට පෙළෙහි සවි ශක්තිය උදෙසාත් මූරගල යොදාගෙන ඇති බව දක්වේ.
- කැටයම් රහිත ගල් පුවරුවක් ලෙස ආරම්භ වූ මූරගල ක්‍රමයෙන් විවිධ කැටයම්වින් අලංකාර වී ඇත.
  1. කැටයම් රහිත පුවරුව
  2. පුන්කලස සහිත මූරගල
  3. බහිරව රූව සහිත මූරගල
  4. නාග රූව සහිත මූරගල
  5. නා රජු සහිත මූරගල

- අනුරාධපුර යුගයේ විවිධ කැටයම් සහිත ව විකාශනය වූ මූරගල පසු ව එම කැටයම් සියල්ල සංකලනය කරමින් නා රජ රූපය සහිත ව ඉතා උසස් කලා ලක්ෂණ සහිත ව නිර්මාණය වීම සිදු වී ඇත.
- විවිධ අවස්ථාවල මූරගල කළගල්, ගඩොළු හා බදාම යන මාධ්‍ය එක්කර නිර්මාණය කර ඇත.

විවිධ අවධි අනුව කලාත්මක අතින් උසස් මූරගල් නිර්මාණ

අනුරාධපුර යුගය
රත්නප්‍රාසාදයේ මූරගල

පොළොන්නරු යුගය
පොළොන්නරු වටදාගෙයි මූරගල

අනුරාධපුරයේ රත්න ප්‍රාසාද මූරගල

පොළොන්නරුවේ වටදාගෙයි මූරගල

1. මූරගල යනු කුමක් දැයි හඳුන්වා ඒ පිළිබඳ තොරතුරු ඇතුලත් පුවත්පත් ලිපියක් සකස් කරන්න.

2 .ඉහත කියවීම් පත්‍රිකාවට අදාළව රූප සටහන් සමගින් කෙටි සටහනක් නිර්මාණය කර සටහන පොතේ ලියන්න